# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.10.27 පැය 0540 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/1949/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

## 01. පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලොන්නරුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2025.10.26 වන දින අළුයම් කාලයේදී දියබෙදුම පොලිස් වසමේ නුවරගේයාය ප්‍රදේශයේදී පොලොන්නරුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු කැණීම් උපකරණ හා පූජා භාණ්ඩ සමග අත්අඩංගුවට ගෙන දියබෙදුම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් අවුරුදු 20, 22 හා 43 යන වයස්වල පසුවන පුත්තලම හා අත්තනකඩවල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

දියබෙදුම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - කපුගොල්ලෑව පොලිස් ස්ථානය.

2025.10.26 වන දින දහවල් කාලයේදී කපුගොල්ලෑව පොලිස් වසමේ දුටුවැව ප්‍රදේශයේදී කපුගොල්ලෑව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු කැණීම් උපකරණ හා පූජා භාණ්ඩ සමග අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 65 ක් වූ දුටුවැව, කපුගොල්ලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කපුගොල්ලෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - රස්නායකපුර පොලිස් වසම.

2025.10.26 වන දින සවස් කාලයේ රස්නායකපුර පොලිස් වසමේ මුඩත්තව වැවෙහි පුද්ගලයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට ලද පණිවිඩයක් මත රස්නායකපුර පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 68 ක් වූ මොන්නෑකුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මියගිය පුද්ගලයා ටියුබයක් ආධාරයෙන් මාළු ඇල්ලීම සිදුකරන අයෙකු වන අතර නිවසට පැමිණීම ප්‍රමාද වීම හේතුවෙන් නිවැසියන් විසින් සොයා බැලීමේදී වැවෙහි මැදට වන්නට මරණකරුගේ මෘත ශරීරය තිබී හමුවී ඇත.

මෘත ශරීරය නිකවැරටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර රස්නායකපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. සැකකටයුතු මරණයක් - බද්දේගම පොලිස් වසම.

2025.10.26 වන දින රාත්‍රී කාලයේ බද්දේගම පොලිස් වසමේ මහලියනගේවත්ත ප්‍රදේශයේ තනිව පදිංචිව සිටි කාන්තාවක් දින කිහිපයක සිට දක්නට නොමැති බවටත් නිවසේ විදුලි පහන් දල්වා තිබූ බැවින් සැකයක් පවතින බවටත් බද්දේගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

බද්දේගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් එම නිවස පරික්ෂා කිරීමේදී නිවසේ පදිංචිව සිටි කාන්තාව නිවසේ සාලය තුල යටිකය නිරුවත්ව මියගොස් සිටි අතර මෘත ශරීරයෙන් ලේ වහනය වී ඇති බවටත් නිරික්ෂණය වී ඇත.

**මරණකාරිය වයස අවුරුදු 48 ක් වූ සංදරවල, බද්දේගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරික්ෂණය සඳහා පොලිස් ආරක්ෂාව යටතේ සිද්ධිය වූ ස්ථානයේ ඇති අතර බද්දේගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - වැල්ලවාය පොලිස් වසම.

2025.10.26 වන දින සවස් කාලයේ වැල්ලවාය පොලිස් වසමේ වැල්ලවාය තණමල්විල මාර්ගයේ ආදාවෙලයාය ප්‍රදේශයේදී තණමල්විල දෙස සිට වැල්ලවාය දෙසට ගමන් කල යුධ හමුදාවට අයත් බස් රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු වැල්ලවාය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 36 ක් වූ රජමාවත, වැල්ලවාය ප්‍රදේශයේ පදිංචි පොලිස් සැරයන්වරයෙකි.**

මෘත ශරීරය වැල්ලවාය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වැල්ලවාය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**